## ගරු බස්නාරහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



ජනතාවගේ ජනාවාස ගැටළුවට සහ නාගාරිකරණ ක්‍රියාවලියට අවදානයට යොමු කරමින් වාර්ෂිකව සමරනු ලබන ලෝක ජනාවාස දිනය මෙම වසරේ ඔක්තෝබර් මස 06 වන දින සමරනු ලබයි.

එයට සමාගාමීව ක්‍රියාත්මක කරන විවිධ සංවර්ධන වැඩ පිළිවෙල දිවයින පුරා ක්‍රියාත්මක වුවද 2008 වසරේ ජනාවාස දින වැඩ සටහන මොරටුව නගරය මුල් කොට පැවැත්වීම සතුට දනවන කරුණකි.

කොළඹ නගරයට තදාසන්න නගරයක් ලෙසින් සීඝ්‍ර සංවර්ධනයකට යොමුවී ඇති මොරටුව නගරය මෙවර ජනාවාස දිනය නිමිත්තෙන් විධිමත් සංවර්ධන ක්‍රියාදාමයකට යොමුවී තිබේ. එය ජනාවාස හා නාගරික සංවර්ධන ක්‍රියාවලියට මෙන්ම එවන්වූ සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ එහි ප්‍රතිලාභ ලබන ජනතාවගේ සහභාගිත්වයෙන් ලැබීම වැදගත්වේ.

එවන්වූ ක්‍රියාකාරකම් තුල දේශපාලන නායකත්වයේ මැදිහත්වීම හා මඟපෙන්වීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතුවේ. 2008 ලෝක ජනාවාස දිනය නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය ගරු ෆේරියල් අෂ්රොෆ් මැතිණියගේ හා නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පුරෝගාමීත්වයෙන් ක්‍රියාත්මකවීම හේතුවෙන් එම වැඩ පිළිවෙලට ජාතික මට්ටමින් දේශපාලන නායකත්වයක් හිමිවී ඇත.

එමෙන්ම ප්‍රදේශයේ මහජන නියෝජිත ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජීවන් කුමාරණතුංග මැතිතුමන් මෙන්ම මොරටුව නගරාධිපති ගරු සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමන් වෙතින් අදාල සංවර්ධන කටයුතු සඳහා ලැබෙන දායකත්වය වඩාත් කැපී පෙනේ. මෙම සියළුම කාර්යයන් සාර්ථක කර ගැනීම වෙනුවෙන් නන් අයුරින් දායකවූ සැමට මාගේ කෘතඥතාවය මෙයින් පුද කරනු කැමැත්තෙමි.

**රෙජිනෝල්ඩ් කුරේ**
**බස්නාරහි පළාත් ප්‍රධාන අමාත්‍ය**